ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2008

**පරිපාලන නීතිය – LWU 3311**

කාලය - පැය තුනයි

---

දිනය: 2008 අප්‍රේල් මස 02 වන දින    වේලාව: පෙ ව 9.30 ප. ව. 12.30 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. "අභිමතය යනු බලධාරීන්ගේ අභිමතය ඇතුලත කළ යුතු යම් දෙයක් පෞද්ගලික මතයට අනුව නොව තර්කකානුකූල හා යුක්තියේ රීතිවලට අනුකූලව කිරීම වශයෙන් අදහස් වේ". - එච්. ඩබ්. ඩී. වේඩ් හා සී. එෆ්. ෆෝර්සයිත් "පරිපාලන නීතිය" 7 වන සංස්කරණය 387 වන පිටුව.

   ඔබ මෙම ප්‍රකාශය සමග එකග වන්නෙහි ද? පරිපාලන ක්‍රියාවන් පිළිබඳ අධිකරණ පාලනය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

2. රොබට් චූකලී රුරිටානියාවේ ඩැකෝටා පොලිස් ස්ථානයේ කොස්තාපල්වරයෙකි. නීතිවිරෝධී මත්පැන් පෙරන්නෙකුගෙන් රොබට් අල්ලසක් ලබා ගත් බවට වූ චෝදනාවක් සම්බන්ධයෙන් ඩැකෝටාහි සහකාර පොලිස් අධිකාරිවරයා මූලික විමර්ශනයක් ආරම්භ කළේය. පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සාක්ෂි රොබර්ට්ගේ වරද ඔප්පු කිරීම සඳහා අසතුටුදායක වූ හෙයින් රොබර්ට්ට අවවාද කළ සහකාර පොලිස් අධිකාරිවරයා ඔහුව චෝදනාවෙන් නිදහස් කළේය. පසුව රොබර්ට් අල්ලසක් ලබා ගනිද්දී අදාල සහකාර පොලිස් අධිකාරිවරයා විසින් රොබර්ට් අල්ලා ගන්නා ලදී. රොබර්ට්ගේ වැඩ තහනම් කළ සහකාර පොලිස් අධිකාරිවරයා පොලිස් නිලධාරීන්ගේ උසස්වීම් හා ස්ථාන මාරුවීම් සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පියවර ගැනීමේ ව්‍යවස්ථාපිත බලතල තිබූ පොලිස් සේවා කොමිෂන් සභාව වෙත අදාල කරුණු යොමු කළේය.

   පොලිස් කොමිෂන් සභාව මේ පිළිබඳ පරීක්ෂණයක් පැවැත්විය. ඩැකෝටාහි සහකාර පොලිස් අධිකාරිවරයා පරීක්ෂණ මඩුල්ලේ සභාපතිත්වය ඉසිලීය. පරීක්ෂණයට කලින් දිනයේ දී රොබරට් වෙත චෝදනා පත්‍රයක් නිකුත් කරන ලදී. තමාට පරීක්ෂණයට පෙනී සිටීම සඳහා වෙනත් දිනයක් ලබා දෙන ලෙස රොබර්ට් ඉල්ලා සිටියේය. වසර දෙකක ශිෂ්‍යත්වයක් සඳහා තමා විදේශගත වන හෙයින් පරීක්ෂණය කල් දැමිය නොහැකි බව පරීක්ෂණ මඩුල්ලේ සභාපතිවරයා ප්‍රකාශ කළේය. සියලු සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම සඳහා පරීක්ෂණ මඩුල්ල විසින් රොබර්ට්ට අවසර දුන් නමුදු නීතිඥයෙකු යොදවා ගැනීම සඳහා ඔහු විසින් කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. වහාම ක්‍රියාත්මක කරන ලද පරිදි රොබර්ට් සේවයෙන් නෙරපන ලද බව පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් සතියකට පසුව රොබර්ට්ට දන්වන ලදී.

   රොබර්ට් මෙම තීරණය අභියෝගයට ලක් කිරීමට අදහස් කරයි. ඔහුට උපදෙස් දෙන්න.

3. 'වාර්තාව මතුපිට නීතියේ දෝෂයක් මත පදනම් වූ පහළ විනිශ්චය සභාවක තීරණයක්, එම තීරණය අවලංගු කරමින් සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කිරීම සඳහා හේතු වන බව පිළිගත් නීතියක් වේ'.

ඔබ මෙම අධිකරණ වාචිකය සමග එකග වන්නෙහි ද? තීරණය කරන ලද නඩු තීන්දු ඇසුරෙන් ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

4. ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා වෙළඳ බලපත් නිකුත් කිරීම පිණිස අයදුම්පත් භාර ගැනීම සඳහා ආහාර පණත යටතේ වාණිජ හා අභ්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යවරයාට බලතල ඇත . ආහාර ද්‍රව්‍ය නිෂ්පාදකයන්ගෙන් ආහාර ද්‍රව්‍යයන්හි ආදර්ශක ලබාගෙන ඒවා පරීක්ෂාවට ලක් කිරීම පිණිස වාණිජ හා අභ්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලකයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට පණත මගින් අමාත්‍යවරයාට බලතල දී තිබුණි. කමිටුවේ නිර්දේශ මත පදනම්ව තමා සුදුසු යැයි සිතන්නේ නම් අමාත්‍යවරයා විසින් නිෂ්පාදකයන්ට වෙළඳ බලපත්‍ර නිකුත් කළ යුතු විය.

සුප්‍රකට ආහාර ද්‍රව්‍ය නිෂ්පාදකයකු වූ සුරනිමල් පැකට් කරන ලද කිරි, බෝතල් කරන ලද කිරි හා විවිධ රසයන්ගෙන් යුත් යෝගර්ට් ඇතුළත් සිය කිරි නිෂ්පාදන සඳහා බලපත්‍රයක් ඉල්ලා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළේය. අදාළ ආදර්ශක කමිටුව වෙත ඉදිරිපත් නොකළ අමාත්‍යවරයා සුරනිමල්ගේ නිෂ්පාදන තත්ත්වයෙන් බාල බව පවසමින් කිරි නිෂ්පාදන සඳහා සුරනිමල්ට බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළේය. කෙසේ වුව ද කමිටුවේ නිර්දේශය ලබා නොගනිමින් අමාත්‍යවරයාගේ සහෝදරියගේ බෑණා වන වෙනත් කිරි ආහාර නිෂ්පාදකවරයෙකුට අමාත්‍යවරයා විසින් බලපත්‍රයක් ලබා දී ඇති බව සුරනිමල්ට පසුව දැනගන්නට ලැබුණි. වෙළඳපලේ ඇති වෙනත් කිරි නිෂ්පාදන හා සමග සසඳා බලන කල තම නිෂ්පාදන මිලෙන් අඩු හා උසස් තත්ත්වයෙන් පවතින බව සුරනිමල් කියා සිටී. සිය ව්‍යාපාරය සඳහා බැංකු ණය ලබාගෙන ඇති හෙයින් තම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීම නිසා තමා මූල්‍යමය දුෂ්කරතාවලට මුහුණ දී ඇති බව ද ඔහු පවසයි.

පරිපාලන නීති ක්ෂේත්‍රය තුළ අධිකරණ විසින් වර්ධනය කරන ලද අදාළ මූලධර්ම ඇසුරෙන් මෙහි ඉස්මතු වන කරුණු සාකච්ඡා කරන්න.

5. 'ප්‍රකාශන ආඥා ප්‍රතිකර්මය ලබා දීමේ කිරීමේ අධිකරණ බලය ඇති අධිකරණය සම්බන්ධයෙන් ඇති මතභේදය හේතුකොටගෙන පරිපාලන ක්‍රියා ප්‍රශ්න කිරීමේ සඵල ආයුධයක් වශයෙන් එම ආඥාවේ වැදගත්කම අඩු වී ඇත' .

ප්‍රකාශන ආඥා නිකුත් කිරීම සම්බන්ධයෙන් අධිකරණ බලයේ ගැටලුව ඇසුරෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

6. මාර්ග, අතුරු මාවත්, අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පිට්ටනි සහ ගංගා ඉවුරු නඩත්තු කිරීම හා ප්‍රදේශයේ පිරිසිදු වාතාවරණයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වෙනත් පියවර ගැනීම සහ නිදහස් සනීපාරක්ෂා සේවාවන්, බෝට්ටු සේවාවන්, ජලය හා විදුලිය වැනි වෙනත් මහජන උපයෝගිතා පවත්වාගෙන යාම සඳහා සිවපුරි නගර සභාවට ව්‍යවස්ථාවකින් බලතල ලබා දී ඇත . පසුගිය මාස කිහිපයක් තිස්සේ වාහන පිරිසිදු කිරීමේ සේවාවක් විසින් වාහනවල එන්ජින් තෙල් සහ අපිරිසිදු ජලය ඇතුළු සිය අපද්‍රව්‍ය ගංගාවට

මුදා හරිමින් සිටී. මෙම ක්‍රියාවන් ගම්වැසියන්ට, විශේෂයෙන් සිය වගාවන් සඳහා ජලය ලබා ගැනීම හා ස්නානය හා නිවාසවල පරිහරණය සඳහා ගංගාව භාවිත කළ පුද්ගලයන්ට විශාල දුෂ්කරතා ඇති කිරීමට හේතු විය. මෙලෙස පිට කරන අපද්‍රව්‍ය නිසා ගංගාවේ ජලයේ අපිරිසිදු වීම හේතුකොටගෙන ගමේ කුඩා ළමෝ රෝගාබාධවලට ලක් වූහ. ගම්වැසියෝ වාහන පිරිසිදු කිරීමේ සේවාවේ ක්‍රියාවන් නිසා තමන් මුහුණ දී ඇත සෞඛ්‍යමය ගැටලු පිළිබඳව සිවපුරි නගර සභාවේ සභාපතිවරයාට ලිඛිතව පැමිණිලි කර සිටිය ද එම ක්‍රියාවන් නතර කිරීම සඳහා කිසිදු ඵලදායී පියවරක් නොගන්නා ලදී.

තමනට මේ සම්බන්ධයෙන් කිසියම් ප්‍රතිකර්මයක් ඇත්දැයි සිවපුරි ගමේ වැසියෝ ඔබෙන් විමසති. ඔවුනට උපදෙස් දෙන්න.

7. බ්‍රිටැනිකා විදුලිබල මණ්ඩලය වූකලී බ්‍රිටැනිකාවේ පාර්ලිමේන්තු පණතක් මගින් පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. විදුලි බල මණ්ඩලය විසින් සිය සේවකයන් සඳහා බරපතල රෝග ප්‍රතිකාර සඳහා ආධාර කිරීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. එම යෝජනා ක්‍රමයට අනුව වසර පහක සේවාවක් සම්පූර්ණ කළ ස්ථිර සේවකයකු මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති රෝග පිළිබඳ ලැයිස්තුවේ සඳහන් කිසියම් රෝගයකින් පෙළෙන්නේ නම් ඔහුට මණ්ඩලයෙන් මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා හිමිකම් ඇත . 'කවර හෝ කරුණක් සම්බන්ධයෙන් මණ්ඩලය ගන්නා තීරණය අවසානාත්මක වන අතර කිසිදු අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුත්තේය' යනුවෙන් පණතේ 3 වන වගන්තියේ සඳහන් විය.

වසර 12 ක සේවයක් සම්පූර්ණ කර ඇති ජෝන් බ්‍රිටැනිකා විදුලිබල මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරිවරයෙකි. ලැයිස්තුගත රෝගයක් වූ හදවතේ ධමනි රෝගයක් සම්බන්ධයෙන් ඔහුට ශල්‍ය කර්මයක් සිදු කිරීමට නියමිත විය. එහෙයින් ඔහු මූල්‍ය ආධාර සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළේය. ජෝන්ට ඉහළ වැටුපක් ලැබෙන් හෙයින් ඔහුට මණ්ඩලයෙන් මූල්‍යාධාර අවශ්‍ය නොවන බව පවසමින් බ්‍රිටැනිකා විදුලිබල මණ්ඩලය ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. ඔහු මණ්ඩලයේ සභාපතිවරයා හමු වී මෙම තීරණය ගැන විමසා සිටි විට මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් තම තීරණය අවසානාත්මක වන බව සභාපතිවරයා පැවසීය. බ්‍රිටැනිකා විදුලිබල මණ්ඩලයේ තීරණය අධිකරණයක දී තමාට ප්‍රශ්න කළ හැකි දැ යි ජෝන් ඔබෙන් විමසයි.

බ්‍රිටැනිකාවේ නීතිය ශ්‍රී ලංකාවේ නීතියට සමාන බව උපකල්පනය කරමින් ජෝන්ට උපදෙස් දෙන්න.

8. 'නූතන යුගයේ දී පරිපාලන යාන්ත්‍රණයේ ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා අභිනියෝජිත නීති අත්‍යවශ්‍ය වේ. කෙසේ වුව ද පුරවැසියාගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා ඒවා යම්කිසි පාලනයකට යටත් කර තිබීම අවශ්‍ය වේ'.

අභිනියෝජිත නීති පිළිබඳ අධිකරණ පාලනය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

\- හිමිකම් ඇවිරිණි. -